පොලිසියට පහරදුන්නේ යැයි පැවසෙන සිදුවීමක් සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම අයවලුන්ව අත්අඩංගුවට ගත් අවස්ථාවක, ඊට චෝදනා ලැබූ කාන්තා පාර්ශවය පමණක් ඉස්මතු කරමින් සිදුකළ වාර්තාකරණයන්, පුවත්පත් (08/11) සහ රූපවාහිනී ප්‍රධාන පුවත් (07/11) තුළ දක්නට ලැබුනි.

"කාන්තාවන් 6ක් ඇතුළු 10ක්" , "කාන්තාවන් 4ක් ඇතුළු 10ක්" , "කතුන් 6ක් ඇතුළු 10ක්" වැනි සිරස්තල ඔස්සේ මෙසේ කාන්තාවන් පමණක් ඉස්මතු කොට දක්වා තිබිණි.

කෙසේ නමුත්, ඇතැම් මාධ්‍ය විශේෂයෙන් සැකකරුවන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය සඳහන් නොකරමින් සහ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම පිළිබඳව සඳහන් කරමින්, මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූලව මෙම සිදුවීම පිළිබඳ වාර්තා කළ අවස්ථාවන්ද නිරීක්ෂණය කළ හැකි විණි.

1. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම එකම වරදක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ අවස්ථාවක, මෙලෙස කාන්තා පාර්ශවය පමණක් ඉස්මතු කිරීම, කාන්තාවන්ට එකී වරදෙහි වැඩි වගකීමක් පැවරීමක් යැයි ඔබ සිතන්නේ ද?

2. එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගෙන කරනු ලබන කොන් කිරීමක් නොවන්නේ ද?

3.එසේ නම්, මෙම දක්වා ඇති මාධ්‍ය අතුරින්, ඔබ තෝරාගන්නේ කුමන වාර්තාකරණයන් ද?